ආබාධ සහිතව ජීවත් වන්නවුන්ද සමාජයේම කොටසකි. ඔවුන් සමාජය තුළ කිසිමාකාරයක කොන් කිරීමකට ලක් නොවිය යුතු බවද නොකිවමනායි. ඔවුන්ව හැඳින්වීම සඳහා පුද්ගල මූලික භාෂාවක් (Person-first language) යොදාගැනීම වඩාත් යෝග්‍ය වන්නේය යන කතිකාව ඇතිවන්නේ ද ඒ හෙයිනි. එහිදී disabled වැනි ආබාධය මූලික කොටගත් හැඳින්වීම් වෙනුවට, a person with a disability වැනි පුද්ගලයාව මූලික කොටගත් හැඳින්වීම් වඩාත් යෝග්‍ය වන බව පැවසේ.

මාධ්‍ය තුළ ආබාධ සහිත වූවන් හැඳින්වීම සඳහා පුද්ගල මූලික භාෂාව ඇතැම් විට භාවිතා වන නමුත්, එසේ නොවන අවස්ථාවන් ද තිබේ. ආබාධ සහිත පුද්ගලයන් සඳහා වූ ජාතික මහලේකම් කාර්යාලය මගින් සංවිධානය කර තිබූ වැඩසටහනක් පිළිබඳව මව්බිම පුවත්පතෙහි (11/17) පළවූ පුවත් වාර්තාව ඊට නිදසුනකි. එහි සිරස්තලයේ "ආබාධිත පුද්ගලයන්" යනුවෙන් සඳහන් වූ නමුදු, අන්තර්ගතය තුළ "ආබාධ සහිත පුද්ගලයන්" යනුවෙන් දැක්විණි.

කෙසේ නමුත්, බොහෝ විට පුවත් වාර්තාවන්ට සිරස්තල යොදන්නේ එම පුවත් වාර්තාව ලියූ මාධ්‍යවේදියා නොව පුවත්පත් කර්තෘවරයෙකු බව, මාධ්‍යවේදීන් විසින් අප වෙත ඉදිරිපත් කර ඇති අදහස් අනුව පැහැදිලි වන බවද මෙවැනි අවස්ථාවන්හිදී සැලකිල්ලට ගත යුතුයි.

ඒ අනුව,

1) ආබාධය මූලික කොටගත් "ආබාධිත" යන යෙදුම වෙනුවට, පුද්ගලයාව මූලික කොටගත් "ආබාධ සහිත" යන යෙදුම එහිදී වඩාත් යෝග්‍ය නොවේ ද?
2) එසේ නැතිනම් පුද්ගල මූලික භාෂාවක් අනුව ඔවුන්ව හැඳින්විය හැකි වෙනත් යෙදුමක් ඔබට යෝජනා කළ හැකිද?

මූලාශ්‍ර:

https://www.aucd.org/docs/add/sa_summits/Language%20Doc.pdf
https://cdrnys.org/.../the-disability-dialogue-4.../